## රජයේ නිවේදන

## 2018 අංක 35 දරන මුදල් පනත යටතේ වන නිවේදනය

2018 අංක 35 දරන මුදල් පනතේ 19 වන වගන්තිය සමඟ කියවිය යුතු 51 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මඟින් මෙම පනතේ 19 වන වගන්තිය සමඟ කියවිය යුතු 51 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද 2019 ඔක්තෝබර් 31 දිනැති අංක 2147/72 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ නියෝගයන් හි 4 වන වගන්තියෙහි (ආ) උපවගන්තියට පසුව පහත නව උපවගන්තිය ඇතුළත් කරමින් සංශෝධනය කරමි.

"(ඇ) කෙසේ වුවද, උක්ත (අ) සහ (ආ) උපවගන්ති වල සඳහන් ණයවර ලිපියට කරනු ලබන සංශෝධන, පහත කොන්දේසි තෘප්ත කරන්නේනම් සහ ආනයනකරු විසින් යහපත් අරමුණින් කරනු ලබන්නේ නම් එම සංශෝධන භාණ්ඩාගාර ලේකම්වරයාට සලකා බැලිය හැකිය."

(i) ඉහත ණයවර ලිපියේ සඳහන් මොටර් වාහනය පුද්ගලික පරිහරණය සඳහා පමණක් ආනයනය කළ යුතු අතර වාණිජ පරමාර්ථයෙන් ආනයනය නොකළ යුතු වීම;

(ii) ඉහත ණයවර ලිපියේ සඳහන් මොටර් වාහනය අදාල ණයවර ලිපිය සංශෝධනය කිරීමට භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත් පුද්ගලයාගේ නමින් පමණක් ලියාපදිංචි විය යුතු වීම;

(iii) මෝටර් වාහනය පළමු ලියාපදිංචි දිනයේ සිට වසරක් ගතවන තුරු වෙනත් පුද්ගලයකුට එම මෝටර් වාහනය පැවරිය නොහැකි වීම; සහ

(iv) උක්ත (i), (ii) හා (iii) කොන්දේසි ඇතුළත් කරමින් දිවුරුම් ප්‍රකාශයක් භාණ්ඩාගාර ලේකම්ට ඉදිරිපත් කිරීම මඟින් පමණක් ඉහත ණයවර ලිපියේ සංශෝධනය අදාල කිරීමට භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියට ඉල්ලීමක් කිරීම

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.